සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ....................................

## ආර්ථික විද්‍යාව - I


කාලය පැය 02 යි

උපදෙස්
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍රයේ නියමිත පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

(01) පහත සඳහන් ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී ප්‍රකාශය තෝරන්න.
(1) ආර්ථික අර්බුදය අවම කිරීමට රුපියලේ බාහිර අගය ඉහළ යාමට ඉඩ හැරිය යුතු ය.
(2) පරිගණකයක වෙළඳපොළ මිල රුපියල් ලක්ෂයක් පමණ වේ.
(3) වර්තමාන ශ්‍රී ලංකාවේ නිරුද්ධමන තත්වයක් දැකගත හැකි ය.
(4) ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර වෙළඳ පරතරය වැඩි වෙමින් පවතී.
(5) අස්වැසුම දුප්පතුන් ඉලක්ක කරගත් ව්‍යාපෘතියකි.

(02) නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ තීරණය තම තමන්ගේ ස්වාර්ථය මත නිෂ්පාදකයින්ට හා පාරිභෝගිකයින්ට ගතහැකි වන්නේ,
(1) සම්ප්‍රදායික ආර්ථිකයක ය.
(2) විධාන ආර්ථිකයකය ය.
(3) මිශ්‍ර ආර්ථිකයක ය.
(4) වෙළඳපොළ ආර්ථිකයක ය.
(5) සමාජීය වෙළඳපොළ ආර්ථිකයක ය.

(03) එක්තරා ආර්ථිකයක් සම්බන්ධ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහතින් දැක්වේ.




මෙම ආර්ථිකයේ නිෂ්පාදනය A සිට B දක්වා ගමන් කිරීමෙන් නිරූපණය වන්නේ,
(1) ආර්ථිකයේ සමස්ත ඉල්ලුම ඉහළ යාම.
(2) ආර්ථික වර්ධන අනුපාතිකය ඉහළ යෑම.
(3) ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම නිසා පූර්ණ නිෂ්පාදිතය ඉහළ යාමයි.
(4) ආර්ථික වර්ධනයකට මුහුණ දීමයි.
(5) පවත්නා සම්පත් පූර්ණ සේවා නියුක්තියක් හා පූර්ණ නිෂ්පාදනයකින් තොරව භාවිතා කිරීම යි.

(04) සාමාන්‍යපෙළ හොඳින් සමත් ශිෂ්‍යයෙකු උසස් පෙළ විෂය ධාරාවක් තෝරා ගැනීමේ ආවස්ථික පිරිවැය සමාන වන්නේ,
(1) උපකාරක පන්ති වෙනුවෙන් දරන වියදම
(2) උසස් පෙළ පාඨමාලාව වෙනුවෙන් ගතකරන කාලය
(3) පහසුකම් සේවා ගාස්තු වියදම්
(4) අපේක්ෂිත රැකියාවෙන් අහිමි වැටුප් ආදායම
(5) උසස් පෙළ නියැලෙන කාලය තුළ වැය කරන ලද ප්‍රවාහන පිරිවැය.

(05) පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?

(1) ඉල්ලුම් වක්‍රය මත කිසියම් ලක්ෂ්‍යයක් ඉල්ලුම නිරූපණය කරයි.
(2) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂයන් අතර ගමන් කිරීම ඉල්ලුම වෙනස් වීමයි.
(3) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීම ඉල්ලුම් ප්‍රසාරණය නිරූපණය කරයි.
(4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීම ඉල්ලුම් සංකෝචනය නිරූපණය කරයි.
(5) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂයන් අතර ගමන් කිරීම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම නිරූපණය කරයි.

(06) භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන් කරනුයේ පහත සඳහන් කවරක් ද?

(1) නිෂ්පාදන පිරිවැයෙහි පහළ යාමක්
(2) භාණ්ඩයේ මිල ඉහළ යාමක්
(3) නිෂ්පාදන පිරිවැයෙහි ඉහළ යාමක්
(4) භාණ්ඩයේ මිල පහළ යාමක්
(5) ඉල්ලුම අඩු වීමක්

(07) භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රයේ විතැන්වීමක් නොමැතිව එහි මිල වැඩිවීමක් සිදුවිය හැකි අවස්ථාවක් වනුයේ,

(1) නිෂ්පාදනයට අදාළ ශ්‍රම ඵලදායිතාවයේ වැඩි වීමක්.
(2) අදාළ භාණ්ඩයේ පරිභෝජන මට්ටමේ ඉහළ යාමක්.
(3) නිෂ්පාදනයේ යෙදෙන ශ්‍රමිකයන් ගේ වැටුප් වැඩි වීමක්.
(4) පාරිභෝගිකයන්ගේ මූර්ත ආදායමේ ඉහළ යාමක්.
(5) අදාළ භාණ්ඩයේ නිෂ්පාදනය මත අයකළ බදු කප්පාදුවක්.

(08) ඉහළ සිට පහළට බෑවුම්වන ඉල්ලුම් වක්‍රයට මධ්‍ය ලක්ෂ්‍යයට ඉහළ ප්‍රදේශයේදී මිල අඩු වන අවස්ථාවකදී.

| නම්‍යතා සංගුණකය | ව්‍යාපාර අයභාරය |
|---|---|
| (1) ඒකීය වේ. | ඉහළ යයි. |
| (2) එකට අඩු වේ. | පහළ යයි. |
| (3) ඒකීය වේ. | උපරිම වේ. |
| (4) එකට වැඩි වේ. | වැඩි වේ. |
| (5) ශූන්‍ය වේ. | පහළ යයි. |

(09) එක්තරා භාණ්ඩයක සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය පිළිවෙළින් රු. 20 හා ඒකක 400ක් විය. මෙම භාණ්ඩයට අදාළ ඉල්ලුම් වක්‍රයේ බෑවුම $\left(\frac{\Delta P}{\Delta Q}\right)$ -0.1 සිට - 0.2 දක්වා වෙනස් වුවහොත් පැවති සමතුලිත මිල යටතේ ඉල්ලුම් නම්‍යතාව වෙනස්වන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) -0.5 සිට -1 දක්වා වෙනස් වේ.
(2) -0.5 සිට -0.25 දක්වා වෙනස් වේ.
(3) -2 සිට -4 දක්වා වෙනස් වේ.
(4) -4 සිට -2 දක්වා වෙනස් වේ.
(5) -0.05 සිට -0.01 දක්වා වෙනස් වේ.

(10) පහත සඳහන් ඒවායින් භාණ්ඩ හා සේවා වෙළඳපොළ ලක්ෂණයක් නොවන්නේ,

(1) නිෂ්පාදන ආයතනවලට සාධක සේවා සපයන්නේ කුටුම්භ අංශයයි.
(2) පාරිභෝගික භාණ්ඩ හා සේවා හුවමාරුවේ.
(3) කුටුම්භ අංශය භාණ්ඩ හා සේවා ඉල්ලුම් කරයි.
(4) නිෂ්පාදන ආයතන භාණ්ඩ හා සේවා සපයයි.
(5) භාණ්ඩ හා සේවා සඳහා ඍජු ඉල්ලුමක් පවතී.

(11) පහත දැක්වෙන්නේ වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතයන්ට අදාළ සමීකරණ දෙකකි.

Qd = 100 - 5P

Qs = -20 + 5P

සමීකරණවලට අදාළව අධි ඉල්ලුම් සමීකරණය, වෙළඳපොළ සමතුලිත මිල හා සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | අධි ඉල්ලුම් සමීකරණය | වෙළඳපොළ සමතතුලිත මිල | සමතුලිතයේදී ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|---|
| (1) | Ed = -120 + 10P | 12 | -13.5 |
| (2) | Ed = 120 - 10P | 12 | -1.5 |
| (3) | Ed = 100 + 10P | 6 | 13.5 |
| (4) | Ed = 120 - 10P | 12 | +1.5 |
| (5) | Ed = -120 - 10P | 0 | 1.5 |

(12) පහත දැක්වෙන්නේ වෙළඳපොළක භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ දෙකකි.

Qd = 425 - 25P

Qs = 200 + 50P


මෙම භාණ්ඩයේ අළෙවිය මත රජය රු. 1.50 ස්ථාවර බද්දක් හෝ රු. 1.50 සහනාධාරයක් හෝ වෙළඳපොළ තුළ සිදු කරන්නේ නම් බද්දට හෝ සහනාධාරයට පසු වෙළඳපොළ සමතුලිත මිල පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මිල රු. 4 හෝ රු. 3 (2) මිල රු. 4 හෝ රු. 4 (3) මිල රු. 4 හෝ රු. 2

(4) මිල රු. 12 හෝ රු. 4 (5) මිල රු. 3 හෝ රු. 4

(13) පහත දැක්වෙන්නේ කෙසෙල් නිෂ්පාදනය සම්බන්ධ සැපයුම් වක්‍රයක් ඉල්ලුම් වක්‍රයක් දැක්වෙන සටහනකි. මෙහි නිෂ්පාදකයාගේ මුළු අයභාරය මුලු විචල්‍ය පිරිවැය හා නිෂ්පාදන අතිරික්තය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | මුළු අයභාරය | මුළු විචල්‍ය පිරිවැය | නිෂ්පාදන අතිරික්තය |
|---|---|---|---|
| (1) | NPEQ | NPEQ | NPE |
| (2) | ONPE | OPEQ | PTE |
| (3) | OPEQ | ONEQ | ONEQ |
| (4) | ONEQ | NPE | OPEQ |
| (5) | OPEQ | ONEQ | NPE |




(14) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය Qd = 800 - 10P වන සැපයුම් සමීකරණය Qs = -100 + 10P වේ. මෙම භාණ්ඩය මත රු. 60.00 ක සහතික මිලක් ලබා දී ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමයක් අනුගමනය කිරීමට රජය එකඟ විය. සහතික මිල ලබාදීමෙන් අනතුරුව ඌණ පූර්ණ ගෙවීම සඳහා රජය දරණ වියදම හා ව්‍යාපාරික අයභාරය ඉහළ ගිය ප්‍රමාණය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | ඌණ පූරණ ගෙවීම සඳහා රජය දරන වියදම | ව්‍යාපාරික අයභාරය ඉහළ ගිය ප්‍රමාණය |
|---|---|---|
| (1) | රු. 30000 | රු. 30000 |
| (2) | රු. 10500 | රු. 14250 |
| (3) | රු. 15000 | රු. 7500 |
| (4) | රු. 15000 | රු. 14250 |
| (5) | රු. 4500 | රු. 2250 |

(15) කතිපයාධිකාරී වෙළඳපොළ ව්‍යුහයක ලක්ෂණයක් නොවන්නේ,

(1) ආයතන මිල සකසන්නෙකි.

(2) වෙළෙඳපොලේ සමජාතිය වූ හෝ ප්‍රභේදනය වූ හෝ භාණ්ඩ වීම.

(3) ප්‍රචාරණය පවතී.

(4) වෙළඳපොළ තොරතුරු ලබාගැනීම අතිශය දුෂ්කර වීම හා රහසිගත වීම.

(5) දැඩි ලෙස අන්‍යොන්‍ය රැඳියාවක් දක්නට නොලැබීම.

(16) පූර්ණ තරගකාරී ආයතනයක, කෙටි කාලයේදී ලාභ උපරිම කෙරෙන නිමැවුම් ප්‍රමාණය ඒකක 500ක් වන විට ඒකකයක වෙළඳපල මිල වන්නේ රු. 70.00 කි. මෙම නිමැවුම් ප්‍රමාණයේ දී ඒකක විචල්‍ය පිරිවැය රු. 50.00ක් වන අතර ඒකක ස්ථාවර පිරිවැය රු. 40.00 කි. මෙවැනි පිරිවැය තත්වයක් තුළ අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී නම්, ලාභ උපරිම කිරීමට කටයුතු කරන මෙම ආයතනයෙහි කෙටිකාලීන හැසිරීම වන්නේ,


(1) දිගින් දිගටම පාඩු ලැබීමක් සිදුවෙතැයි සිතා ආයතනය වසා දැමීම ය.
(2) අලාභ අවම කිරීමේ අපේක්ෂාව ඇතිව කෙටි කාලයේදී නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමය.
(3) පිරිවැය අඩුකරන ලාභ උපරිම කරගැනීමේ අරමුණින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඩුකිරීම සඳහා නිමැවුම වැඩි කිරීමය.
(4) වෙළඳපොළ මිලට වඩා සාමාන්‍ය මුළු පිරිවැය වැඩිවීම නිසා සිදුවන අලාභය අවම කිරීම සඳහා ආයතනය වසා දැමීමය.
(5) භාණ්ඩයේ මිල රු. 70.00 සිට රු. 90.00 කට වඩා වූ මිලකට නියම කිරීමය.

(17) යෙදවුමක හීනවන ඵල හටගන්නා විට,

(1) මුළු විචල්‍ය පිරිවැය වැඩිවන වේගයෙන් වැඩි වේ.
(2) සාමාන්‍ය විචල්‍ය පිරිවැය ක්‍රමයෙන් අඩු වේ.
(3) මුලු විචල්‍ය පිරිවැය අඩුවෙන වේගයෙන් වැඩි වේ.
(4) සාමාන්‍ය ඵල ක්‍රමානුකූලව වැඩි වේ.
(5) සාමාන්‍ය ස්ථාවර පිරිවැය ඉහළ නගී.

(18) පහත රූපසටහනට අනුව, ඒකක 150ක සමතුලිත නිමැවුමක් පවතින කෙටිකාලීන නිෂ්පාදන ආයතනයක, ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය හා ආර්ථික ලාභය දැක්වෙන නිවැරදි වරණය වන්නේ,

| | මුළු ස්ථාවර පිරිවැය | ආර්ථික ලාභය |
|---|---|---|
| (1) | රු. 15000 | රු. 2000 |
| (2) | රු. 6000 | රු. 3000 |
| (3) | රු. 3000 | රු. 6000 |
| (4) | රු. 4500 | රු. 6250 |
| (5) | රු. 6250 | රු. 3000 |




(19) ව්‍යාපාර චක්‍රයක සංකෝචනාත්මක අදියරේදී,

(1) උද්ධමනය පහළ යාම සහ සේවා නියුක්තිය ඉහළ යාමක් සිදු විය හැකි ය.
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටීම හා උද්ධමනනය පහළ යා හැකි ය.
(3) මූර්ත දළ දේශිය නිෂ්පාදිතය ඉහළ යාම හා සේවා නියුක්තිය ඉහළ යා හැකි ය.
(4) මූර්ත දළ දේශිය නිෂ්පාදිතය ඉහළ යාම හා සේවා වියුක්තිය අඩුවිය හැකි ය.
(5) මූර්ත දළ දේශිය නිෂ්පාදිතය පහළ යාම හා උද්ධමනය ඉහළ යා හැකි ය.

(20) නිමැවුමේ දළ වටිනාකමින් දළ එකතුකළ අගය ලබාගැනීම සඳහා පහත දැක්වෙන දෑ අතුරින් කවර ගැළපීමක් කළ යුතු ද?

(1) අතරමැදි පරිභෝජනය අඩුකළ යුතු ය. (2) ශුද්ධ වක්‍ර බදු එකතු කළ යුතු ය.
(3) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩුකළ යුතු ය. (4) ශුද්ධ ප්‍රාථමික ආදායම් එකතු කළ යුතු ය.
(5) ප්‍රාථමික යෙදවුම් එකතු කළ යුතු ය.

(21) වැයකළ හැකි කුටුම්බ ආදායම වඩාත් නිවැරදි ව දැක්වෙන්නේ,

(1) දළ ජාතික ආදායම - වක්‍ර බදු + නොබෙදූ ලාභ - සංක්‍රාම
(2) දළ ජාතික ආදායම + සංක්‍රාම - ආදායම් බදු - අපනයන
(3) දළ ජාතික ආදායම - සංක්‍රාම + වක්‍ර බදු + ක්ෂය වීම
(4) දළ ජාතික ආදායම - කුටුම්භවලට නොලැබුණු ආදායම - ආදායම් බදු + සංක්‍රාම
(5) දළ ජාතික ආදායම - වක්‍ර බදු + සංක්‍රාම - කුටුම්භවලට නොගෙවූ ආදායම්


(22) රටක ජාතික ගිණුම් දත්ත කීපයක් පහත දැක්වේ. (රු. බි. වලින්)

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 12300 |
| පරිභෝජන වියදම් | 8500 |
| විදේශ ශුද්ධ ද්විතියික ආදායම් | 900 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් | -300 |

මෙම ආර්ථිකයේ දේශීය ඉතුරුම් කොපමණ වේද?

(1) රු. බි. 3200 කි. (2) රු. බි. 3800 (3) රු. බි. 11400 කි.
(4) රු. බි. 12000 කි. (5) රු. බි. 13200 කි.

(23) එක්තරා සරල ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය හා පරිභෝජන ශ්‍රිතය




(1) $S = 500 + 0.2yd$ සහ $C = 100 + 0.8yd$
(2) $S = -100 + 0.4yd$ සහ $C = 100 + 0.6yd$
(3) $S = 100 + 0.8yd$ සහ $C = 500 + 0.2yd$
(4) $S = -100 + 0.2yd$ සහ $C = 100 + 0.8yd$
(5) $S = -500 + 0.2yd$ සහ $C = 500 + 0.8yd$

(24) ආන්තික පරිභෝජන නැඹියාව(MPC) 0.8 ක් සහිත කල්පිත ආර්ථිකයක රු. මි. 200ක ප්‍රතිගමනාත්මක පරතරයක් පවතී යයි සිතන්න. රජය මෙම පරතරය ඉවත් කිරීම සඳහා ඍජු බදු යොදා ගැනීමට තීරණය කරයි නම් ඍජු බදු කොතරම් ප්‍රමාණයකින් වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ ද?

(1) රු. මි. 40කින් පහත හෙළිය යුතු ය. (2) රු. මි. 40කින් ඉහළ දැමිය යුතු ය.
(3) රු. මි. 160කින් පහත හෙළිය යුතු ය. (4) රු. මි. 200කින් ඉහළ දැමිය යුතු ය.
(5) රු. මි. 320කින් ඉහළ දැමිය යුතු ය.

(25) කල්පිත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ. (රු. බි.)

| | |
|---|---|
| ඉතුරුම් | 150 |
| ආයෝජන | 130 |
| බදු අයකිරීම් | 140 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | 120 |

මෙම ආර්ථිකයේ සමතුලිත මට්ටමේදී ශුද්ධ අපනයන කොපමණ ද?

(1) 20කි. (2) 30 කි. (3) 40 කි.
(4) 250කි. (5) 540කි.

(26) පහත සඳහන් දෑ අතුරෙන් පූර්ණ ද්‍රවශීල වත්කම කුමක් ද?

(1) ඉතුරුම් තැන්පතු (2) චෙක්පත් (3) කාලීන තැන්පතු
(4) බැංකු මුදල් (5) ආසන්න මුදල්

(27) පොළී අනුපාතිකය අඩුවන විට සමපේක්ෂකයින් මුදලට කරන ඉල්ලුම වැඩිකරනු ලබන්නේ,

(1) මුදල් ශේෂ වෙතින් මූල්‍ය වත්කම් කරා මාරුවන බැවිනි.
(2) මුදල් ශේෂ වෙතින් මූර්ත දේපොළ කරා මාරුවන බැවිනි.
(3) මූල්‍ය වත්කම් වෙතින් මුදල් ශේෂ කරා මාරුවන බැවිනි.
(4) පිළිනපත් වෙතින් මූර්ත වත්කම් කරා මාරුවන බැවිනි.
(5) මූර්ත දේපොළ වෙතින් මූල්‍ය වත්කම් කරා මාරුවන බැවිනි.

(28) මූල්‍ය පදනම තුළ ඇතුළත් පහත සඳහන් සංරචක අතරින් මූල්‍ය සමස්තයට අයත්වන්නේ කවරක් ද?

(1) මහජනයා සතුවන ව්‍යවහාර මුදල්

(2) වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්

(3) මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු

(4) රාජ්‍ය නියෝජිත ආයතන සතු මහ බැංකුව වෙත ඇති තැන්පතු

(5) වාණිජ බැංකුවල ඇති ව්‍යවස්ථාපිත සංචිත

(29) විනිමය සමීකරණයෙහි PY (PT) මගින් පෙන්නුම් කරන්නේ,

(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගයයි.

(2) මුදල් සැපයුමේ අගයයි.

(3) මිල මට්ටමේ ප්‍රමාණයයි.

(4) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ අගයයි.

(5) මුදල් ඒකකයක් අතින් අත මාරුවන වාර ගණනයි.

(30) වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණ වන්නේ,

(1) මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීමයි.

(2) මුදල් සැපයුම පාලනය කිරීමයි.

(3) මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි

(4) සමාහාර නිමැවුමට බලපෑම් කිරීමයි.

(5) මිල ස්ථායිතාව හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගැනීමයි.

(31) වෙළඳපොළ ආර්ථිකයක පොදු භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශය මැදිහත්වීමට හේතුවක් ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද?

(1) රජයට ශුභසාධනය සැපයීමේ වගකීම පැවරී තිබීම.

(2) ලාභ ඉපයීමේ මූලික කොන්දේසියක් වන මිලක් අය කිරීමේ නොහැකියාව

(3) සාපේක්ෂව අඩු පිරිවැයක් සහ ඉහළ කාර්යක්ෂමතාවක් සහිතව සැපයිය හැකි වීම.

(4) පෞද්ගලික ආයතන සතුව සුදුසු තාක්ෂණයක් නොමැති වීම.

(5) සාපේක්ෂව අඩු මිලක් පැවතීම නිසා ලාභ ආන්තික පහළ මට්ටමක පැවතීම.

(32) පහත රූප සටහනේ දැක්වෙන්නේ භාණ්ඩයක් පරිභෝජනය කිරීමේදී ඍණ බාහිරතාවයක් හේතුවෙන් වෙළඳපොළ අසමත්වීමේ අවස්ථාවකි. සම්පත් භාවිතයේ අකාර්යක්ෂමතාව තුළින් අහිමිවන සුභසාධනය නිරූපණය කරන ප්‍රදේශය වන්නේ,


(1) AFB ත්‍රිකෝණය මගිනි.

(2) CED ත්‍රිකෝණය මගිනි.

(3) BCD ත්‍රිකෝණය මගිනි.

(4) ABC ත්‍රිකෝණය මගිනි.

(5) BFC ත්‍රිකෝණය මගිනි.




(33) පහත සඳහන් කරුණුවලින් එකක් හැර ඉතිරි ඒවා නූතන වෙළඳපොළ ආර්ථිකයක් තුළ ආණ්ඩුවක් විසින් ඉටුකරනු ලබන කාර්යයන් වේ. ආණ්ඩුවේ කාර්යයන්ට අයත් නොවන කරුණ තෝරන්න.

(1) වෙළඳපොළ යාන්ත්‍රණය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික පදනම සකස් කිරීම.

(2) ලාභ නොලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.

(3) වෙළඳපොළ යාන්ත්‍රණය මගින් සිදුවන සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවන් ඉවත් කිරීමට ක්‍රියා කිරීම.

(4) සාධාරණ සම්පත් ව්‍යාප්තියක් ඇති කිරීම.

(5) ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීම හා සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම.

(34) රජය සෘජු බදු පැනවීම නිසා **බිහි නොවිය හැකි යයි** සැලකිය හැක්කේ කවරක් ද?

(1) පෞද්ගලික පරිභෝජනය අඩු වීම. (2) බදු පැහැර හැරීම පහසුවීම.
(3) මිල මට්ටම ඉහළ යෑම. (4) ක්‍රය ශක්තිය පහළ වැටීම.
(5) කුටුම්බ වැයකළ හැකි ආදායම පහත වැටීම.

(35) 2022 වර්ෂයේදී අයවැය හිඟය, ඉතුරුම් අනුපාතය හා ආයෝජන අනුපාතය නිවැරදිව දැක්වෙන වරණය මින් කවරක් ද?

| | අයවැය හිඟය | ඉතුරුම් අනුපාතය | ආයෝජන අනුපාතය |
|---|---|---|---|
| (1) | 11.7 | 33.0 | 36.7 |
| (2) | 9.0 | 34.5 | 38.1 |
| (3) | 10.6 | 35.1 | 33.2 |
| (4) | 10.2 | 33.1 | 34.4 |
| (5) | 5.0 | 37.3 | 31.5 |

(36) තේ නිෂ්පාදනය පිළිබඳව ඉන්දියාවට වඩා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසියක් පවතී නම් ඉන් අදහස් වන්නේ,

(1) ඉන්දියාවට වඩා වැඩියෙන් ශ්‍රී ලංකාවට තේ නිෂ්පාදනය කළ හැකි බවයි.
(2) ශ්‍රී ලංකාවට වඩා ඉන්දියාවේ තේ මිල වැඩි බවයි.
(3) ඉන්දියාවට වඩා අඩු සම්පත් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කරනු ලබන බවයි.
(4) ඉන්දියාවට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් ශ්‍රී ලංකාව තේ නිපදවන බවයි.
(5) ඉන්දියාවට වඩා අඩු සම්පත් පිරිවැයකින් ශ්‍රී ලංකාව තේ නිපදවන බවයි.

(37) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය තුළ කාර්මික හා කෘෂිකාර්මික අංශවල දායකත්වය නිවැරදිව පෙන්නුම් කෙරෙන්නේ පහත සඳහන් කවර වරණයකින් ද?

| | කාර්මික භාණ්ඩ | කෘෂි භාණ්ඩ |
|---|---|---|
| (1) | 75.6% | 22.8% |
| (2) | 77.8% | 20.6% |
| (3) | 78.9% | 20.0% |
| (4) | 79.8% | 19.6% |
| (5) | 80.9% | 18.8% |

(38) කිසියම් රටක වෙළඳ අනුපාත දර්ශකයට අදාළ දත්ත 2016 - 2020 අතර කාලය තුළ පහත පරිදි වේ.

| වර්ෂය | වෙළඳ අනුපාතය |
|---|---|
| 2016 | 100 |
| 2018 | 94 |
| 2020 | 85 |

මෙම දත්තවලට අනුව මෙම ආර්ථිකයේ,

(1) ආනයන මිලට සාපේක්ෂව අපනයන මිල ඉහළ නැග ඇත.
(2) අපනයන මිලට සාපේක්ෂව ආනයන මිල ඉහළ නැග ඇත.
(3) ආනයන මිල ස්ථාවරව තිබියදී අපනයන මිල ඉහළ නැග ඇත.
(4) වෙළෙඳ ශේෂයේ අතිරික්තය ඉහළ ගොස් ඇත.
(5) ආනයන පරිමාව වැඩි වූ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන පරිමාව අඩු වී ඇත.

(39) පහත සඳහන් අයිතම අතුරෙන් ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුමට ඇතුළත් වනුයේ කවරක් ද?

(1) ආයෝජනය ආදායම් ලැබීම් හා ගෙවීම් අතර වෙනස.
(2) පුද්ගලයන්ගේ ශුද්ධ විදේශ ප්‍රේෂණ
(3) ශුද්ධ විදේශ ආයෝජන වත්කම් වල හටගත් වෙනස්කම්
(4) අදෘශ්‍ය අපනයන හා ආනයන අතර වෙනස
(5) විදේශ ආයෝජන වලින් උපයාගත් ලාභ(ශුද්ධ)

(40) කිසියම් කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ගනුදෙනුවල තෝරාගත් දත්ත කීපයක් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| අයිතමය | රුපියල් බිලියන |
|---|---|
| වෙළෙඳ ගිණුම (ශුද්ධ) | -200 |
| ශුද්ධ අපනයන | -170 |
| ශුද්ධ ප්‍රාථමික ආදායම් | -80 |
| ද්විතියික ආදායම් ශේෂය | 160 |
| ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) | 50 |
| වැරදීම් හා අත්හැරීම් | 5 |

ඉහත තොරතුරුවලට අනුව මෙම ආර්ථිකයේ ගෙවුම් ශේෂ තත්ත්වය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) රු. බි. 30ක හිඟයක් සේවා ගිණුමෙහි පවතී.

(2) රු. බි. 40ක හිඟයක් ජංගම ගිණුමෙහි පවතී.

(3) රු. බි. 35ක අතිරික්තයක් මූල්‍ය ගිණුමෙහි පවතී.

(4) රු. බි. 40 ක හිඟයක් මූල්‍ය ගිණුමෙහි පවතී.

(5) ජංගම හා ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) රු. බි. 35ක හිඟයක් පවතී.

(41) විනිමය අනුපාතිකයේ හටගන්නා ක්ෂයවීමකින් පසු ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය අඩුවිය හැක්කේ පහත සඳහන් කවර තත්ත්වයකදී ද?

| | අපනයන මිල නම්‍යතාවය | ආනයන මිල නම්‍යතාවය | අපනයන සැපයුම් නම්‍යතාව |
|---|---|---|---|
| (1) | 1.0 | 0.9 | 1.8 |
| (2) | 0.2 | 0.7 | 1.1 |
| (3) | 0.1 | 0.5 | 1.0 |
| (4) | 0.6 | 0.3 | 0.3 |
| (5) | 0.8 | 0.1 | 0.1 |

(42) 2021 දෙසැම්බර් මාසයේ සිට 2022 සැප්තැම්බර් මාසය වනවිට ඇමරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 320 සිට රුපියල් 290 දක්වා වෙනස් වූයේ නම් පහත සඳහන් කවර සාධකයක් ඒ සඳහා හේතුවිය හැකි ද?

(1) මූර්ත දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම.

(2) ආනයනික භාණ්ඩ සඳහා කරනු ලබන ඉල්ලුම ඉහළ යාම.

(3) දේශීය උද්ධමන අනුපාතිකය ඉහළ යාම.

(4) අපනයන සඳහා විදේශීය ඉල්ලුම ඉහළ යාම.

(5) විදේශ විනිමය මිලට ගැනීමට සැපයෙන දේශීය මුදල් ප්‍රමාණය ඉහළ යාම.

(43) 2021 ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලට අනුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මානව සංවර්ධන දර්ශකයේ අගය හා අත්කරගෙන ඇති ස්ථානය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 0.78 හා 71 වේ. (2) 0.79 හා 70 වේ. (3) 0.79 හා 71 වේ.

(4) 0.78 හා 73 වේ. (5) 0.76 හා 72 වේ.

(44) පංචමක අපකිරණ අනුපාතයෙන් මනිනු ලබන්නේ,

(1) උපතේදී ආයු අපේක්ෂාවයි. (2) දුනුමයි.

(3) ආදායම් ව්‍යාප්ති විෂමතාවයයි. (4) ජනගහන වර්ධන වේගයයි.

(5) ප්‍රතිශීර්ෂ ආදායමයි.

(45) පහත සඳහන් සූත්‍රය භාවිතා කරමින් රටක් ගණනය කරනු ලබන්නේ කුමක් ද?

$$\frac{\text{දරිද්‍රතා ඉමට පහළින් සිටින ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$$

(1) ජනගහන දරිද්‍රතා දර්ශකය (2) පරිභෝජන දරිද්‍රතා දර්ශකය

(3) දරිද්‍රතා අන්තර් දර්ශකය (4) බහුමාන දරිද්‍රතා දර්ශකය

(5) දරිද්‍රතා තීව්‍රතා දර්ශකය

(46) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව වැඩිම දිස්ත්‍රික්කය හා පළාත දැක්වෙන පිළිතුර වන්නේ,
(1) කිලිනොච්චිය හා උතුර (2) යාපනය හා උතුර (3) මුලතිව් හා ඌව
(4) මුලතිව් හා උතුරුමැද (5) නුවරඑළිය හා ඌව

(47) කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළඳපොළ තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.
මුළු ජනගහනය මිලියන 30
ළමා ජනගහනය මිලියන 05
අක්‍රීය ශ්‍රම බලකාය මිලියන 05
සේවා නියුක්ති ජනගහනය මිලියන 17
ඉහත තොරතුරු වලට අනුව ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය හා සේවා නියුක්ති අනුපාතය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) 80% ක් හා 85% කි. (2) 80% ක් හා 70% කි. (3) 68% ක් හා 70% කි.
(4) 65% ක් හා 80% කි. (5) 66% ක් හා 58% කි.

(48) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වැඩිම ආර්ථික වර්ධනයක් වාර්තාකළ වර්ෂය හා අඩුම ආර්ථික වර්ධනයක් වාර්තා කළ වර්ෂය ඇතුලත් නිවැරදි වරණය මින් කවරක් ද?

| | වැඩිම ආර්ථික වෘද්ධිය වාර්තාකළ වර්ෂය | අඩුම ආර්ථික වෘද්ධිය වාර්තාකළ වර්ෂය |
|---|---|---|
| (1) | 2011 | 2001 |
| (2) | 2012 | 2022 |
| (3) | 2008 | 2019 |
| (4) | 2010 | 2021 |
| (5) | 2015 | 2020 |

(49) නිදහසින් පසු කාලය තුළ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ අවධිය වනුයේ,
(1) 1948 - 1964 දක්වා අවධිය යි. (2) 1961 - 1977 දක්වා අවධිය යි.
(3) 1977 - 1994 දක්වා අවධිය යි. (4) 2005 - 2010 දක්වා අවධිය යි.
(5) 2005 - 2015 දක්වා අවධිය යි.

(50) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයේ සේවා නියුක්තිය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්,

| | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
|---|---|---|---|
| (1) | 8.1 | 56.3 | 44 |
| (2) | 8.5 | 54.6 | 45 |
| (3) | 19.9 | 52.8 | 40 |
| (4) | 27.3 | 26.0 | 46.7 |
| (5) | 26.5 | 26.5 | 47.0 |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකයඃ ......................................

# ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි

(කියවීමට අමතර කාලය වි. 10 යි.)

උපදෙස්

- 'අ' උපකොටසේ අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## (''අ'' - උප කොටස)

01 (i) (අ) ආර්ථික සම්පත් යනුවෙන් කවරක් අදහස් වේද? (ලකුණු 02)

(ආ) ස්වාභාවික සම්පත් නොමිල භාණ්ඩ වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) (අ) හිගකම යන සංකල්පය පැහැදිලි කොට හිගකම හා ආවස්ථික පිරිවැය යන සංකල්ප එකිනෙක බැඳී පවතින්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) හිගකම හා ආවස්ථික පිරිවැය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මගින් පෙන්නුම් කරන්න. (ලකුණු 02)

(iii) ''වෙළඳපොල යාන්ත්‍රණය ක්‍රියාත්මක වන ආර්ථිකයක රාජ්‍ය නිර්බාධවාදයක් පැවතියද ආණ්ඩුවට වැදගත් කාර්යභාරයක් පවතී.'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ආර්ථික වශයෙන් අකාර්යක්ෂමතාවක් පෙන්නුම්කරන ආර්ථිකයක දැකිය හැකි ලක්‍ෂණ පහක් දක්වන්න. (ලකුණු 05)

02 (i) "ඉල්ලුම" වුවමනා සංකල්පය මෙන් පුළුල් ෂේත්‍රයක් වෙනුවට පටු ක්‍ෂේත්‍රයක් නිරූපණයක කරන සංකල්පයකි. "සඵල ඉල්ලුම" තුළ ගැබ්ව ඇති ප්‍රධාන කරුණු දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පෞද්ගලික ඉල්ලුම හා වෙළඳපොල ඉල්ලුම අතර වෙනස දක්වෙන ප්‍රධාන සාධකය ඇතුළත් ඉල්ලුම කෙරෙහි බලපාන තවත් සාධක දෙකක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) (අ) මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් දැකිය නොමැකි අවස්ථා කීපයක් ආර්ථික න්‍යායයේ හඳුනාගෙන තිබේ. එවැනි අවස්ථා 03ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iv) සැපයුම වෙනස්වීමට බලපාන ප්‍රධාන සාධක පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(v) කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ අධි ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට අදාළ සමීකරණ පහත දක්වේ.

අධි ඉල්ලුම් සමීකරණය : $Ed = 300 - 6P$

සැපයුම් සමීකරණය : $Qs = -100 + 4P$

(අ) වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (සමීකරණ භාවිතයෙන්) (ලකුණු 03)

(ආ) වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇඳ සමතුලිත මිල ප්‍රමාණය ලකුණුකොට දක්වන්න. (ලකුණු 02)

(ඇ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව සොයන්න. (ලකුණු 01)

03 භාණ්ඩයක ඉල්ලුම හා සැපයුම් සමීනරණ පහත දක්වේ.

ඉල්ලුම් වක්‍රය $Qd = 10 - P$

සැපයුම් වක්‍රය $Qs = -5 + 2P$

(i) (අ) නිර්බාද වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ආ) රජය අළෙවි ඒකකයක් මත රු. 1.50ක බද්දක් පැනවූයේ නම් ඉල්ලුම නොවෙනස් වේ යැයි උපකල්පනය කොට නව සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න.

(ඉ) ඒකක බද්දෙන් ගැණුම් කරුවන් හා විකුණුම් කරුවන් දරණ ප්‍රමාණයක් කොපමණ ද?

(ඊ) බද්දෙන් පසු පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයේ කෙබඳු වෙනසක් සිදුවේ ද?

(උ) ඒකක බද්දෙන් රජයට උපයාගත හැකි ආදායම කොපමණ ද? (ලකුණු 2 × 5)

(ii) නම්‍ය සහ අනම්‍ය ඉල්ලුම් තත්වයකදී ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර බදු බර බෙදීයන ආකාරය රූප සටහන් මගින් දක්වන්න. (ලකුණු 04)

(iii) සමතුලිත භාණ්ඩ වෙළඳපොළකට රජය මැදිහත් වී නිෂ්පාදකයා වෙත ඒකක සහනාධාරයක් ලබාදීමට තීරණය කරයි නම් සහනාධාරය ගැණුම්කරුවනන් හා සැපයුම් කරුවන් අතර බෙදී යන ආකාරය ප්‍රස්තාර සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ඉල්ලුම් වක්‍රය ඍණ බෑවුමක් සහ සැපයුම් වක්‍රය ධන බෑවුමක් සහිත බව උපකල්පනය කරන්න.)

(ලකුණු 04)

(iv) ස්වාරක්ෂක තොග යන්න කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 02)

04 (i) කිසියම් කර්මාන්තයක වෙළඳපොළ ව්‍යුහය තීරණය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක කවරේද? (ලකුණු 03)

(ii) පහත දී ඇති ප්‍රකාශ සමග ඔබට එකඟ විය හැකි ද නොහැකි දැයි දක්වා, එයට හේතු පැහැදිලි කරන්න.

(අ) ආයතනයක කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙහි ආන්තික ඵලදායීතාව ශුන්‍යයට සමාන වන්නේ මුළු නිෂ්පාදනය උපරිම වන අවස්ථාවේදී ය.

(ආ) කිසියම් නිෂ්පාදන සාධකයක සැපයුම අනම්‍ය වන විට එම සාධකය උපයන ආදායමින් වැඩි කොටසක් සමන්විත වන්නේ ආවස්ථික පිරිවැය හෙවත් සංක්‍රාම ඉපැයීම් වලිනි.

(ඉ) නිෂ්පාදන ආයතනයක මුළු පිරිවැය ඉක්මවූ මුළු අයභාරයේ ප්‍රමාණය නිෂ්පාදන අතිරික්තය ලෙස හඳුන්වයි.

(ඊ) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය, ඉහළට බෑවුම්වන ආන්තික පිරිවැය වක්‍රය මගින් පිළිබිඹු වේ. (ලකුණු 08)

(iii) (අ) පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය වෙළඳපොල ඉල්ලුම් වක්‍රය මගින් ගම්‍යවන ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කොට ආයතන ඉල්ලුම් වක්‍රයෙහි හැඩය තීරණය වීමට බලපාන හේතු 3ක් සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) (අ) ප්‍රත්‍යක්ෂ පිරිවැය (Explicit cost) හා ආරෝපිත පිරිවැය අතර වෙනස පැහැදිලිකර, අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් පසු පෞද්ගලික විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ආරම්භ කරන ශිෂ්‍යයෙකු මුහුණ දෙන ප්‍රත්‍යක්ෂ වියදම් හා ආරෝපිත වියදම් කවරේදැයි දක්වන්න.(ලකුණු 04)

05 (i) මිශ්‍ර ආදායම් හා දළ මෙහෙයුම් අතිරික්තය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) අවසන් පරිභෝජන වියදමත් සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදමත් අතර වෙනසක් පවතින්නේ ඇයි. (ලකුණු 03)

(iii) කල්පිත ආර්ථිකයක් සම්බන්ධ පහත දැක්වෙන දත්ත ඔබට සපයා ඇත. (රු. මි.)

| | |
|---|---|
| සමාහාර පරිභෝජන වියදම් | 15000 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 5000 |
| තොග වෙනස්වීම | 1000 |
| ශුද්ධ අපනයන | -500 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආයාදම් | -200 |
| විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම | 2000 |

පහත දෑ ගණනය කරන්න.

(a) දළ දේශීය නිෂ්පාදිතය

(b) දළ ජාතික ආදායම

(c) දළ දේශීය ඉතුරුම්

(d) දළ ජාතික ඉතුරුම් (ලකුණු 04)

(vi) ආවෘත ආර්ථිකයකට අදාළ දත්ත කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| පරිභෝජනය | $C = 200 + 0.8yd$ |
| ආයෝජනය | $I = 220$ |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | $G = 200$ |
| බදු | $T = 60$ |
| ආණ්ඩුවෙන් කුටුම්භ වෙත දෙන සංක්‍රාම | 50 |

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 02)

(ආ) ආණ්ඩුවේ මිලදී ගැනීම් 300 දක්වා ඉහළ ගියහොත් සමතුලිත ආදායම කොපමණ ද? (ලකුණු 01)

(ඇ) ආණ්ඩුවේ වියදම් ගුණකය ගණනය කරන්න. (ලකුණු 01)

(v) (අ) ඉතුරුම් හා ආයෝජන සමානවීම සහ Y = E මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණයවන ආකාරය ප්‍රස්තාර සටහනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

## "ආ" උප කොටස

06 (i) මුදලට ඇති ගනුදෙනු ඉල්ලුම තීරණය කරන සාධක කවරේ ද? (ලකුණු 03)

(ii) $M_4$ පුළුල් මුදල් සැපයුම කුමන සංරචක වලින් සමන්විත වේද? (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ පසුගිය ආසන්න කාලපරිච්ඡේදය දෙස බලන විට උද්ධමනය ඉතිහාසගත ඉහළ මට්ටමක් කරා ළඟා විය. (කො. පා. මි. ද. අනුව 2022 සැප්තැම්බර් මස වන විට 69.8% ක අගයක් වාර්තා විය.)

ශ්‍රී ලංකාවේ උද්ධමනයට හේතු වූ ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 06)

(iv) මහ බැංකුව සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවන විට, ප්‍රතිපත්ති පොළී අනුපාතික හරහා සමාහර ඉල්ලුමට බලපෑම් කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක රුපියල් බිලියන 800ක සුරැකුම්පත් ද රුපියල් බිලියන 1600ක ණය ද රුපියලල් බිලියන 150ක අධි සංචිතයක් ද රුපියල් බිලියන 3000ක තැන්පතු ද පවතී යැයි සලකන්න.

(අ) 15% ක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවක් යටතේ කටයුතු කරන මෙම බැංකුව සඳහා ශේෂ පත්‍රය පිළියෙල කරන්න. (ලකුණු 02)

(ආ) අනෙකුත් සාධක නොවෙනස්ම තිබියදී සංචිත අවශයතාව 10% දක්වා අඩු කරනු ලැබුවහොත් මෙම බැංකුවේ, අලුතින් නිකුත් කළ හැකි උපරිම ණය ප්‍රමාණය නිකුත් කිරීමෙන් පසු ශේෂපත්‍රය පිළියෙල කරන්න. (ලකුණු 02)

07 (i) සුභසාධන භාණ්ඩ හා අවගුණ භාණ්ඩ අතර වෙනස පෙන්නුම්කොට එක් එක් භාණ්ඩ වර්ගය සඳහා උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04)

(ii) යහපත් බදු ක්‍රමයක ප්‍රධාන ගුණාංග කවරේ ද? (ලකුණු 04)

(iii) (අ) රාජ්‍ය අයවැය ලේඛනයේ වාර්තන ගිණුමේ ශේෂය, සමස්ථ ශේෂය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) අයවැය හිඟය මූල්‍යයන කිරීම නිසා පෞද්ගලික ආයෝජන සහ මුදල් වෙළෙඳපොළී අනුපාතය සඳහා කවර බලපෑමක් සිදුවේ ද? (ලකුණු 04)

(iv) ධන බාහිරතා කරනකොට ගෙන සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වන තැන්හිදී එය නිවැරදි කිරීමට රජයට ගතහැකි ක්‍රියාමාර්ග කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

08 (i) සමාන ශ්‍රම සම්පත් ප්‍රමාණයකින් තායිලන්තය සහ ඉන්දුනීසියාව යන රටවල් දෙකට ඇඟලුම් හා පාපැදි යන භාණ්ඩ දෙවර්ගයෙන් නිපදවිය හැකි ප්‍රමාණයන් පහත වගුව පෙන්නුම් කරයි. මෙම භාණ්ඩ නිපදවීමේදී වෙනත් යෙදවුම් අවශ්‍ය නොවන බව සලකන්න.

| භාණ්ඩය | තායිලන්තය | ඉන්දුනීසියාව |
|---|---|---|
| ඇඟලුම් | 120 | 80 |
| පාපැදි | 60 | 20 |

(අ) භාණ්ඩ දෙවර්ගයෙහි ම නිපදවීම සම්බන්ධයෙන් ඉහළම ඵලදාවකට හිමිකම් කියන රට කුමක් ද? (ලකුණු 02)

(ආ) දෙරටෙහි ම පාපැදියක ආවස්ථික පිරිවැය ඇඟලුම් වලින් ද, ඇඟලුම් ඒකකයක ආවස්ථික පිරිවැය පාපැදි වලින් ද ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ඉ) දෙරටටම වාසිදායක වෙළඳාමක් සිදුවීමට නම් තායිලන්තය හා ඉන්දුනීසියාව අතර ඇඟලුම් හා පාපැදි හුවමාරු විය යුත්තේ කවර අනුපාතයකට ද? (ලකුණු 02)

(ii) විදේශීය තරගයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කරගැනීමට රටවල් විසින් අනුගමනය කරනු ලබන වෙළඳ බාධක කවරේ ද? (ලකුණු 05)

(iii) නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විදේශ ව්‍යවහාර මුදලක මිල ඉහළ යනවිට විදේශ විනිමය වෙළෙඳපොළ තුළ එම විදේශ ව්‍යහාර මුදල් සැපයුම වැඩිවනු ඇද්ද? අඩුවනු ඇද්ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ගෙවුම් තුලන ලේඛනයක් අනිවාර්යයෙන් ම තුලනය වේ නම් ගෙවුම් තුලන අසමතුලිතතාවක් යනුවෙන් අදහස් වන්නේ කවරක් ද? (ලකුණු 05)

09 (i) ආර්ථික වෘද්ධිය අර්ථදක්වා වෘද්ධියේ පිරිවැය ස්වරූප 03ක් දක්වන්න. (ලකුණු 05)

(ii) ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ආර්ථික වෘද්ධියක් සමග ආර්ථික ව්‍යුහයේ සිදුවිය යුතු ගුණාත්මක වෙනස්කම් කවරේ ද? (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු මොනවා ද? (ලකුණු 04)

(iv) මානව දරිද්‍රතාවය මැනීම සඳහා යොදාගන්නා ප්‍රධාන පැතිකඩයන් නම් කරන්න. (ලකුණු 03)

(v) ජනගහනය අතර පවතින මන්දපෝෂණය මානව ප්‍රාග්ධනයේ ඵලදායීතාව මත ඇති කරන ඍජු බලපෑම සහ මානව ප්‍රාග්ධනය මත පරම්පරා වශයෙන් ඇතිකරන දිගුකාලීන බලපෑම හේතුවෙන් ආර්ථික වර්ධනය පසුගාමීකරවන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. වර්ථමානයේ ලංකාවේ මන්දපෝෂණ තත්වය උග්‍රවීමට බලපාන හේතු මොනවා ද? (ලකුණු 04)

10 (i) මූල්‍ය ආරක්ෂණ ජාලයක් යනු කුමක් ද? ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මූල්‍ය ආරක්ෂණජාලයක වැදගතකම කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 06)

(ii) "පශ්චාත් යුධ සමය තුළ දී පවා විදේශීය ඍජු ආයෝජන වැනි ණය නොවන මූල්‍ය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වී ඇත." ශ්‍රී ලංකාවේ පවතින දුර්වල ආයෝජන වාතාවරණය කෙරෙහි බලපා ඇති හේතු මොනවා ද? (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ගැළපුම් වැඩසටහන සඳහා ආධාරවන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකමෙහි අරමුණු මොනවා ද? (ලකුණු 06)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ණය පහසුකම් වැඩ සටහන මගින් ශ්‍රී ලංකාවේ ණය තිරසරභාවය සාක්ෂාත් කරගැනීම සඳහා සපුරාගත යුතු තිරසාර ණය ඉලක්ක කවරේ ද? (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2023
## ආර්ථික විද්‍යාව

**13 ශ්‍රේණිය** **I කොටස** **පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (1) | 2 - (4) | 3 - (2) | 4 - (4) | 5 - (5) | 6 - (3) | 7 - (3) | 8 - (4) | 9 - (2) | 10 - (1) |
| 11 - (2) | 12 - (3) | 13 - (5) | 14 - (4) | 15 - (5) | 16 - (2) | 17 - (1) | 18 - (3) | 19 - (2) | 20 - (1) |
| 21 - (4) | 22 - (2) | 23 - (4) | 24 - (1) | 25 - (3) | 26 - (4) | 27 - (3) | 28 - (1) | 29 - (4) | 30 - (3) |
| 31 - (2) | 32 - (3) | 33 - (2) | 34 - (3) | 35 - (4) | 36 - (4) | 37 - (4) | 38 - (2) | 39 - (3) | 40 - (3) |
| 41 - (1) | 42 - (4) | 43 - (4) | 44 - (3) | 45 - (1) | 46 - (3) | 47 - (1) | 48 - (2) | 49 - (2) | 50 - (5) |

## II කොටස

(01) (i) (අ) සමාජය තුළ අසීමිත වූ වුවමනාවලට සාපේක්ෂව සැපයුමෙහි හිඟකමක් හෝ සීමිතබවත් සහිත ඵලදායී සම්පත් ආර්ථික සම්පත් ලෙස හැඳින්වේ. (ලකුණු 01)

හිඟකමක් සහිතවීම, මිලක් සහිත වීම, ආවස්ථික පිරිවැයක් සහිතවීම, ආර්ථික සම්පත්වල ලක්ෂණ වේ. ආර්ථික සම්පත් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය ව්‍යවසායකත්වය ලෙස වර්ග කරනු ලැබේ.

(ලකුණු 01)

(ආ) ස්වාභාවික සම්පත් යනු නොමිල භාණ්ඩ නොවේ. (ලකුණු 01)

නොමිල භාණ්ඩ යනු ශුන්‍ය මිලකදී අපරිමිත සැපයුමක් හාශුන්‍ය ආවස්ථික පිරිවැයක් සහිත පිරිවැයකින් තොරව අසීමිත ප්‍රමාණයකක් පරිභෝජනය කළ හැකි භාණ්ඩ වේ. (ලකුණු 01)


සීමිත හෝ හිඟ සැපයුමක් සහිත සහ භාවිතයේදී ආවස්ථක පිරිවැයක් හට ගන්නා ස්වාභාවික සම්පත් නොමිල භාණ්ඩ ලෙස නොසැලකේ. (ලකුණු 01)

(ii) (අ) සීමාසහිත සම්පත් සම්භාරයක් පවතින ආර්ථික ක්‍රමයක් තුළ ඒවා භාවිතා කොට අසීමිත මිනිස් වුවමනා සපුරාගැනීමට යාමේදි අවශ්‍යයෙන්ම හිඟකම නැමති කේන්ද්‍රීය ප්‍රශ්නයට හුහුණ දීම ටසිදුවේ. ඒ අනුව අසීමිත වුවමනා සපුරා ගැනීමට සම්පත් ප්‍රමාණත් නොවීම හිඟකමයි.


(ලකුණු 02)

සීමාසහිත සම්පත් ප්‍රමාණයකින් අප කැමති සියලු වුවමනා සපුරාගත නොහැකි බැවින් එහිදී අනිවාර්යයෙන් ම වුවමනා අතර තේරීමක් කිරීමට සිදුවේ. තේරීම් කිරීමට සිදුවන්නේ සම්පත්වල විකල්ප භාවිත හැකියාද ඇති බැවිනි.

පවත්නා විකල්ප අතුරින් එක් විකල්පයක් තෝරාගත් විට සෙසු විකල්ප අත්හැර දැමීමට සිදු වේ. කිසියම් තේරීමක් ආවස්ථික පිරිවැය යනු එම තේරීම නිසා අත්හැර දැමීමට සිදුවන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකමයි. ඒ අනුව හිඟකම හා ආවස්ථික පිරිවැය එකිනෙකට බැඳී පවතින සංකල්ප දෙකකි. (ලකුණු 02)




හැකියා මායිම පිටත පිහිටි ලක්ෂයක නිෂ්පාදනය අත්කරගත නොහැකිය හිඟකම නිසා




හැකියා මායිම මත ලක්ෂයකින් තවත් ලක්ෂයකට ගමන් කිරීමේදී කැප කිරීමක් කිරීමට සිදු වේ.

(iii) පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාවලිය සඳහා ආණ්ඩුව කිසිඳු ආකාරයකින් මැදිහත් නොවීම රාජ්‍ය නිර්බාදවාදය ලෙස හැඳින්වේ. (ලකුණු 02)

වෙළඳපොල ආර්ථික ක්‍රමයක් තුළ මූලික ආර්ථික ප්‍රහ්න මිල ක්‍රමය මගින් විසඳනු ලැබුවද ආණ්ඩුවට පැවරෙන කාර්යභාරයන් පවතී. විශේෂයෙන් වෙළඳපොළ ආර්ථික ක්‍රමයක මූලික පදනම වන පෞද්ගලික දේපොළ හිමිකම නිර්වචනය කිරීම හා සුරක්ෂිතකර දීම සඳහා ආණ්ඩුවට කටයුතු කිරීමට සිදු වේ.

එමෙන්ම ජාතික ආරක්ෂාව සපයාදීම තරඟකාරී වෙළඳපල ක්‍රමයට බාධාකාරී ඒකාධිකාරී ව්‍යාපාර ඉවත් කිරීම, වෙළඳපොළ ක්‍රමය පවත්වාගෙන යාමට අවශ්‍ය මුදල් ක්‍රමය ස්ථාපිත කිරීම පොදු වැඩ සඳහා අවශ්‍ය කරන අරමුදල් සපයා ගැනීම සඳහා බදු අය කිරීම, අවශ්‍යතා අනුව නීතිරීති ක්‍රියාත්මක කිරීම ආදී විශාල කාර්යභාරයක් ආණ්ඩුවට පැවරේ.

(කාර්යයන් සඳහන් කිරීමට) (ලකුණු 02)

(iv) සේවා වියුක්තිය
ඌණ සම්පත් උපයෝජනය
ඌණ නිෂ්පාදනය හෝ අධි නිෂ්පාදනය
නිෂ්පාදන පිරිවැය
උපරිම කාර්යක්ෂමතාවයෙන් සම්පත් උපයෝජනය නොකිරීම.
සමාජ වරණය අනුව භාණ්ඩ නිෂ්පාදනය නොවීම. (කරුණු 5කට ලකුණු 05)

02 (i)
- පාරිභෝගිකයාට එම භාණ්ඩය සඳහා වුවමනාවක් ඇති බව.
- පාරිභෝගිකයාට එම භාණ්ඩය මිලදී ගැනීමට හැකියාවක් ඇති බව. (කරුණු 02කට ලකුණු 02)

(ii)
- සලකා බලන භාණ්ඩයේ මිල
- සම්බන්ධිත භාණ්ඩවල මිල
- පාරිභෝගිකයන්ගේ ආදායම
- පාරිභෝගිකයන්ගේ අභිරුචිය හෙවත් වරණය
- අනාගත අපේක්ෂා
- ගැණුම්කරුවන් සංඛ්‍යාව
- වෙනත් සාධක (සමාජ, දේශපාලන හා පාරිසරික කරුණු)
- (ගැනුම්කරුවන් සංඛ්‍යාවද ඇතුළත් කරුණු 3ට ලකුණු 03යි. ගැනුම්කරුවන් සංඛ්‍යාව ඇතුළත් නොවන පිළිතුරට ලකුණු ලබා නොදෙන්න.)

(iii)
- ගිෆන් භාණ්ඩ නමින් හඳුන්වනු ලබන භාණ්ඩ සඳහා ඉල්ලුම.
- මිල අධික භාණ්ඩ පරිභෝජනය කිරීමට ඇති ඉල්ලුම(ප්‍රදර්ශනාත්මක භාණ්ඩ ඉල්ලුම)
- භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය මිල මත තීරණය කොට භාණ්ඩ ඉල්ලුම් කිරීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලබා දෙන්න. නිවැරදිව කරුණු 03ම ඇතුළත් පිළිතුරට ලකුණු 04ක් ලබා දෙන්න.)

(iv)
- යෙදවුම් මිල වෙනස්වීම(නිෂ්පාදන පිරිවැය)
- නිෂ්පාදන ක්‍රම ශිල්ප(තාක්ෂණය) වෙනස් වීම.
- සම්බන්ධිත භාණ්ඩවලවෙනස්වීම.
- ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල වෙනස්වීම
- සැපයුම්කරුවන් සංඛ්‍යාව වෙනස්වීම.
- ස්වාභාවික කරුණුවල වෙනස්වීම (දේශගුණික සාධක)
- ආයතණයේ අරමුණු වෙනස්වීම.
- ආයතනවල අරමුණු වෙනස්වීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 05කට ලකුණු 05යි.)

(v) (අ) $Ed = Qd - Qs$

$300-6P = Qd - (-100+4p)$

$300-6p = Qd+100-4p$

$300-6p-(100-4p) = Qd$

$300-6p-100+4p = Qd$

$Qd = 200 - 2p$

නිවැරදි ඉල්ලුම් සමීකරණයට ලකුණු 01යි.)

සමතුලිත මිල

$Qd = Qs$

$200-2P = -100+4P$

$-2P-4P = -100-200$

$\frac{-6P}{-6} = \frac{-300}{-6}$

$P = 50$ (ලකුණු 01යි.)


අසමතුලිත ප්‍රමාණය

$Qd = 200 - 2x50$

$Qd = 200-100$

$Qd = 100$ (ලකුණු 01යි.)

(ආ)




(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 02)

(ඇ) මිල ඉල්ලුම් නම්‍යතාව $= \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$

$= b \times p/q$

$= \cancel{2} \times \frac{\cancel{50}^{\,1}}{\cancel{100}_{\,2}}$

$= -1$ (ලකුණු 01)

03 (i) (අ) $Qd = QS$

$10 - P = -5 + 2P$

$-P - 2P = 5 - 10$

$\frac{-3P}{-3} = \frac{-15}{-3}$

$\underline{\underline{P = 5}}$ (ලකුණු 01)

සමතුලිත ප්‍රමාණය

$Qs = 5 + 2P$

$QS = 5 + 2x5$

$QS = -5 + 10$

$QS = 5$ (ලකුණු 01)

(ii) (ආ) බදු පැනවීමෙන් පසු සැපයුම් සමීකරණය

$Qd = -5 + 2(P - t)$

$QS = -5 + 2(P - 1.50)$

$QS = -5 + 2P - 3.00$

$QS = -8 + 2P$

නව සමතුලිත මිල

$Qd = QS$

$10 - P = -8 + 2P$

$-P - 2P = -8 - 10$

$\frac{-3P}{-3} = \frac{-18}{-3}$

$\underline{\underline{P = 6}}$ (ලකුණු 01)

නව සමතුලිත ප්‍රමාණය

$Qd = 10 - P$

$Qd = 10 - 6$

$\underline{\underline{Qd = 4}}$ (ලකුණු 01)

(ඉ) ඒකක බද්දෙන් ගැණුම්කරුවන් දරන ප්‍රමාණය

= නව සමතුලිත මිල - පෙර සමතුලිත මිල

= 6 - 5

= රු. 1.00 (ලකුණු 01)

ඒකක බද්දෙන් ගැණුම්කරුවන් දරණ ප්‍රමාණය = ඒකක බද්ද - ගැණුම්කරුවන් දරණ ප්‍රමාණය

= රු. 1.50 - රු. 1.00

= රු. 0.50 (ලකුණු 01)

විකල්ප ක්‍රමය

(ඊ) පාරිභොගික අතිරික්තයේ වෙනස

$\frac{(5 + 4)}{2} \times 1 = 4.50$ (ලකුණු 01)

නිශ්පාදන අතිරික්තයේ වෙනස


$\frac{(5 + 4)}{2} \times 0.50$ රු. 2.25 (ලකුණු 01)

(උ) ඒකක බද්දෙන් රජයට උපයාගත හැකි ආදායම

ඒකක බද්ද × නව සමතුලිත ප්‍රමාණය

1.50 × 4 = රු. 6.00 (ලකුණු 02)


(ii) • නම්‍ය ඉල්ලුම් තත්වයකදී බදුබර බෙදීයන ආකාරය




▨ පාරිභෝගිකයා දරණ ප්‍රමාණය

▥ නිෂ්පාදකයා දරණ ප්‍රමාණය

• අනම්‍ය ඉල්ලුම් තත්වයකදී බදුබර බෙදීයන ආකාරය





නම්‍ය ඉල්ලුමකදී වැඩි බදුබරක් පාරිභෝගිකයාට වඩා නිෂ්පාදකයා දරයි.

අනම්‍ය ඉල්ලුමකදී බද්දෙන් වැඩි බරක් පාරිභෝගිකයා දරනු ලබයි.

(නිවැරදි ප්‍රස්තාර දෙකක් සඳහා ලකුණු 01 බැගින් 02යි. විස්තරයට ලකුණු 02යි.)

(iii) පාරිභෝගිකයා සහ නිෂ්පාදකයා දරන ප්‍රමාණ ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි ඉහළ කොටස නිෂ්පාදකයා දරන අතර පහළ කොටස පාරිභෝගිකයාට හිමි වේ. මෙහිදී සමතුලිත මිල පහළ යයි. ප්‍රමාණය වැඩි වේ.
(පැහැදිලි කිරීමට ලකුණු 02යි.)




(iv) වෙළඳපොළේ භාණ්ඩයේ මිල පහළ වැටෙන අවස්ථාවන්හිදී ආණ්ඩුව කිසියම් සහතික මිලක් යටතේ භාණ්ඩය මිලදී ගැනීම සඳහා වෙළඳපොළට පිවිසීමත් භාණ්ඩ මිල ඉහළ නගින අවස්ථාවනහිදී ආණ්ඩුව සැපයුම්කරුවෙක් වශයෙන් වෙළඳපොළට පැමිණ ස්වාරක්ෂක තොග මුදාහරිමින් මිල ඉහළයාමේ ප්‍රවණතාව වලක්වා ගැනීමත් ය.(ලකුණු 02)

04 (i) • වෙළඳපොළ තුල සිටින ආයතන සංඛ්‍යාව • නිෂ්පාදනයේ ස්වභාවය
• අලුත් ආයතන වෙළඳපොළට ප්‍රවේශ වීමත්, පවත්නා ආයතන වෙළඳපොලින් ඉවත්ව යාමටත් ඇති පහසු අපහසු බව.
• වෙළඳපොළ තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතන අතර පවතින තරඟකාරීත්වයේ ස්වරූපය.
(කරුණකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)


(ii) (අ) එකඟ වේ.
නිෂ්පාදන ආයතනයක මුළු නිෂ්පාදනය උපරිම වන විට ආන්තික නිෂ්පාදනය ශුන්‍යයට සමාන වේ.

(ආ) එකඟ නොවේ.
සාධක සැපයුම අනම්‍යවන විට එම සාධකය උපයන ආදායමෙන් වැඩි කොටසක් සමන්විත වන්නේ සංක්‍රාම ඉපයීමෙන් නොව, ආර්ථික බදු කුලියෙනි.

(ඉ) එකඟ නොවේ.
නිෂ්පාදන අතිරික්තය ලෙස සැලකෙන්නේ මුලු විචල්‍ය පිරිවැය ඉක්මවූ මුළු අයභාරයේ ප්‍රමාණයයි.

(ඊ) එකඟ නොවේ.
පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය වන්නේ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහලින් පවත්නා වූ ආන්තික පිරිවැය වක්‍රයයි.
(එක් පිළිතුරක් නිවැරදිව පැහැදිලි කිරීම සඳහා ලකුණු 02 බැගින් ලකුණු 08යි. එකඟ විය හැකි නෝ නොහැකි බව පමණක් සඳහන් කිරීමට ලකුණු ලබා නොදේ.)

(iii) පූර්ණ තරඟකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය, තිරස් අක්ෂයට සමාන්තර වූ එනම් පූර්ණ නම්‍ය වන අතර එහි මිල ඉල්ලුම් නම්‍යතා අගය අපරිමිත වේ.
වමේ සිට දකුණට පහළට බෑවුම් වන වෙළඳපොල ඉල්ලුම් වක්‍රයට හා වමේ සිට දකුණට ඉහළට බෑවුම්වන වෙළඳපල සැපයුම් වක්‍රයට අනුව තීරණය වන මිලට, මිල ගනුවෙකු වන පූර්ණ තරඟකාරී වෙළඳපොලක ආයතන ඉල්ලුම් වක්‍රය පහත පරිදි ගම්‍ය කරගත හැක. (ලකුණු 01)



(වෙළඳපොල ඉල්ලුම් වක්‍රය මගින් ආයතන ඉල්ලුම් වක්‍රය ගම්‍ය කරගැනීම අනිවාර්යයෙන් ම දක්වා තිබිය යුතු ය. එසේ නොමැති නම් ලකුණු ලබා නොදේ.)

මේ අනුව පූර්ණ නම්‍ය වූ ඉල්ලුම් වක්‍රයක් ආයතන ඉල්ලුම් වක්‍රය වීමට පහත කරුණු හේතු වේ.

පූර්ණ තරඟකාරී වෙළඳපලක <u>ආයතන විශාල සංඛ්‍යාවක්</u> සිටින නිසා පූර්ණ තරඟකාරී වෙළඳපලක සිටින එක් ආයතනයක් නිපදවනුයේ මුළු වෙළඳපොල තුළ අලෙවිකරන <u>සමජාතීය භාණ්ඩ</u> ප්‍රමාණයෙන් ඉතා නොවැදගත් ප්‍රමාණයකි. එමෙන්ම පූර්ණ තරඟකාරී වෙළඳපලක මිලදී ගනුවන්ට වෙළඳපල පිළිබඳ <u>පූර්ණ තොරතුරු</u> (පූර්ණ දැනුම) පවතින නිසා නිෂ්පාදන ආයතනවලට වෙනස් මිල ගණන් අයකළ හැකි නොවේ.
එබැවින් පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් වෙළඳපොලේ තීරණය වී ඇති මිල අකර්මන්‍ය ලෙස පිළිගන්නාමිල ගනුවෙකු බවට පත් වේ.
එබැවින් වෙළඳපොලේ පැවරුණ මිලක් යටතේ මිල පිළිබඳ බලපෑමක් නොකර පූර්ණ තරඟකාරී ආයතනයක් අලෙවි කටයුතු සිදු කරයි.
මේ හේතු නිසා පූර්ණ තරඟකාරී ආයතනයක් අලෙවි කටයුතු සිදු කරයි.
මේ හේතු නිසා පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තරව පිහිටන පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකි.
(ඉහතින් පෙන්වා දී ඇති ඉරි ඇඳි ලක්ෂණ පැහැදිලි කරමින් පූර්ණ තරඟකාරී ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය යැයි තාර්කිකව පැහැදිලි කරන්නේ නම් පමණක් ලකුණු 03)

(iv)
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතන විසින් පිටතින් මිලදී ගත් යෙදවුම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රමාණය ප්‍රත්‍යක්ෂ පිරිවැය වේ. (ලකුණු 01)
- ආයතනයේ හිමිකරුවන් සතු නිෂ්පාදන සම්පත් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කිරීමේදී කැප කිරීමට සිදුවන හොඳම විකල්ප භාවිතයේ වටිනාකම(ආවස්ථික පිරිවැය ආරෝපිත පිරිවැය වේ.) (ලකුණු 01)
- අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු අ. පො. ස. උසස් පෙළ නොකොට පෞද්ගලික විශ්ව විද්‍යාලයක උපාධිය හැදෑරීමට යාමේ දී දුරීමට සිදුවන

| <u>ප්‍රත්‍යක්ෂ පිරිවැය</u> | <u>ආරෝපිත පිරිවැය</u> |
|---|---|
| • විශ්ව විද්‍යාල කටයුතුවලට අදාල ලිපිද්‍රව්‍ය මිලට ගැනීමේ වියදම | • එම කාලය තුල අ. පො. ස. උසස් පෙළ හැදෑරීමට තිබූ අවස්ථාව අහිමි වීම. |
| • ප්‍රවාහන ගාස්තු වැනි ගමන් වියදම් | • එම කාලය තුල රැකියාවක් කර ආදායම උපයා ගැනීම ට ඇති හැකියාව අහිමි වීම. |
| • විශ්ව විද්‍යාල ගාස්තු | • දෙමාපියන්ගේ ආර්ථික කටයුතුවලට සම්බන්ධ වීමට වූ හැකියාව අහිමි වීම. |
| | • යහළුවන් සමග විනෝද වීමට ඇති හැකියාව අහිමි වීම. |
| | (පිරිවැය වර්ග දෙකෙන්ම එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 02ක්) |

05 (i)
- කේවල ස්වාමී ව්‍යාපාරයක් වශයෙන් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ කුටුම්භ විසින් කරනු ලබන ව්‍යවසායක කටයුතු ආශ්‍රයෙන් ජනනය වන ආදායම් මිශ්‍ර ආදායාම් ලෙස සැලකේ. ආදායම් වෙන් වශයෙන් ගණනය කිරීමේ ප්‍රායෝගික ගැටලු නිසා කුටුම්භ අංශයේ ව්‍යාපාරික කටයුතුවලින් බිහිවන ආදායම් පොදුවේ මිශ්‍ර ආදායම් ලෙස ජාතික ගිණුම්කරණයේදී සැලකේ. (ලකුණු 02)
- නිෂ්පාදන ආයතන නිෂ්පාදනයකරන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකමින් සියලුම පිරිවැය සහ ශුද්ධ බදු අඩුකළ විට ලැබෙන ශේෂය දළ මෙහෙයුම් අතිරික්තයයි. එනම් ව්‍යාපාරික ආයතනයෙන් එකතුකල අගයෙන් සේවක ආදායම් අඩුකළ විට ලැබෙන ශේෂයයි. ඒ අනුව දළ මෙහෙයුම් අතිරික්තය තුළ ශ්‍රමය හැරුණු කොට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා අනෙකුත් සියලුම සාධක සඳහා ජනනය වන ආදායම් හෙවත් පොලිය බදුකුලී හා දළ ලාභ ඇතුලත් වේ. (ලකුණු 02)

(ii)
- භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම සඳහා කරන ලද වියදම අවසන් පරිභෝජන වියදම ලෙස සැලකේ. (ලකුණු 01)
- මුදල් වියදම් කරන්නේ කවරෙක්ද යන්න නොසලකා සැබවින් ම අත්පත් කරගන්නා භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වටිනාකම සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලෙස සැලකේ. (ලකුණු 01)
මෙම සංකල්ප දෙකෙහි වෙනසට හේතු වන්නේ වියදම් දරන්නා සහ පරිභෝජනය කරන්නා එකම ආයතනයක් නොවන අවස්ථා පැවතීමයි. (ලකුණු 01)

(iii) a දළ දේශීය නිෂ්පාදනය = සමාහාර පරිභෝජන වියදම +දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය+ශුද්ධ ආයනයන
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය= දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය + තොග වෙනස්වීම
දළ දේශීය නිෂ්පාදන = 15000 + 6000+ (-500)
= 20500 (ලකුණු 01)

b දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදන + විදේශ ප්‍රාථමික ආදායම්
= 20500 + (-200)
= 20300 (ලකුණු 01)

c දළ දේශිය ඉතුරුම් = දළ දේශීය නිෂ්පාදන - සමාහාර පරිභෝජන වියදම්
= 20500 - 15000
= 5500 (ලකුණු 01)

d දල ජාතික ඉතුරුම් = දළ දේ. ඉතුරුම් + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම්+ විදේශ ශුද්ධ ජංගම සංක්‍රාම
= 5500 + (-200) + 2000
= 7300 (ලකුණු 01)

(iv) (අ) සමතුලිත ආදායම් මට්ටම

$y = C + I + G$
$Y = 200 + 0.8yd + 220 + 200$
$Y = 200 + 0.8(y - T + TR) + 220 + 200$ (ලකුණු 01)
$Y = 620 + 0.8(y - 60 + 50)$
$Y = 620 + 0.8y - 48 + 40$
$Y = 612 + 0.8y$
$Y = 0.8y = 612$
$0.2y = 612$
$Y = \underline{\underline{3060}}$ (ලකුණු 01)

(ආ) ආණ්ඩුවේ වියදම් 300 දක්වා ඉහළ යන විට සමතුලිත ආදායම

$Y = C + I + G$
$Y = 200 + 0.8yd + 220 + 300$
$Y = 200 + 0.8(Y-T+Tr) + 220 + 300$
$Y = 720 + 0.8(Y-T+Tr)220 - 300$
$Y = 720 + 0.8(y - 60 + 50)$
$Y = 720 + 0.8y - 48 - 40$
$Y = 712 + 0.8y$
$Y - 0.8y = 712$
$0.2y = 712$
$y = \frac{712}{0.2}$
$y = 3560$ (ලකුණු 01)


විකල්ප පිළිතුරක්

$KG = \frac{1}{1-b} = \frac{1}{1-b}$
$KG = 5$
$\Delta Y = K\Delta G$
$\Delta Y = 5 \times 100$
$\Delta Y = 500$
$3060 + 500$
$\underline{\underline{Y = 3560}}$

(ඇ) ආණ්ඩුවේ වියදම් ගුණකය

(ලකුණු 01)

(v) $K = \frac{1}{1-b} = \frac{1}{1-MPC} = \frac{1}{0.2} = \underline{\underline{5}}$




(අක්ෂර නම්කර වක්‍ර සියල්ලම නිවැරදි නම් ලකුණු 05යි.)

06 (i)
- මූර්ත ආදායම
- පොලී අනුපාතිකය
- අපේක්ෂිත උද්ධමන අනුපාතිකය
- මිල මට්ටම (කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03)

(ii) $M_4 = M_1 +$ ආසන්න මුදල්

$= M_1 + DBU + NRFC + FCBU + LSB + RFC + LFC$

- මහජනයා සතු කාසි හා නෝට්ටු
- වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු
- විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති ආසන්න මුදල්
- ලියාපදිංචි තැන්පතු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ඇති ආසන්න මුදල් (සංරචක සියල්ලම ඇතුලත් නම් ලකුණු 03)

(iii)
- ආර්ථික වර්ධනය හා එහි ප්‍රතිඵල
- අනාගත මිල විචලනය පිළිබඳ මහජනතාවගේ අපේක්ෂා
- ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්වයන්ට බලපෑම් කිරීම.
  අරමුණු කරගත් මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
- රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්තිවල ප්‍රතිඵල
- ස්වභාවික විපත්
- රුසියානු, යුක්රේන යුද්ධය වැනි වෙනත් බාහිර බලපෑම්,
- ගෝලීය වෙළඳ භාණ්ඩ මිලගණන්වල විචලනයන්
- විනිමය අනුපාතිකයේ වෙනස් වීම.

(කරුණු 1 කට ලකුණු 1 බැගින් මුළු ලකුණු 06 යි.)

(iv)
- සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවන විට ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය වැඩි කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස අන්තර් බැංකු ඒකෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකයන් ක්ෂණිකවම ඉහළ යනු ඇත.
- එවිට වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යන අතර ණය ලබා ගැනීමේ පිරිවැය ඉහළ යාමෙන් ආයෝජන අධෛර්යමත් කරයි.
  ඉතුරුම් අනුපාතික ඉහළ ගොස් පරිභෝජනය පහළ යයි. පරිභෝජන ණය ඉල්ලුම අධෛර්යමත් කරයි.
- මෙලෙස ආයෝජනය හා පරිභෝජනය පහළ යාම සමාහාර ඉල්ලුම අඩු වීමට හේතු වේ.

(ලකුණු 04)

(iv) (අ)

| වගකීම්(රුපියල් බිලියන) | | වත්කම්(රුපියල් බිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 3000 | සංචිත<br>සුරැකුම්පත්<br>ණය | 600<br>800<br>1600 |
| එකතුව | 3000 | එකතුව | 3000 |

(ලකුණු 02)

| වගකීම්(රුපියල් බිලියන) | | වත්කම්(රුපියල් බිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 3300 | සංචිත<br>සුරැකුම්පත්<br>ණය | 600<br>800<br>1900 |
| එකතුව | 3300 | එකතුව | 3300 |

(ලකුණු 02)

07 (i)
- ශුභසාධන භාණ්ඩ හේවත් සුගුණ භාණ්ඩ ලෙස හඳුන්වනු ලබන්නේ එම භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් ඉතා විශාල වශයෙන් බාහිර ප්‍රතිලාභ හටගන්නා එනම් පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා සමාජ ප්‍රතිලාභ ජනනය කර භාණ්ඩයි.
- පරිභෝජනයේදී හටගන්නා ධන බාහිරතා නිසා ශුභසාධන භාණ්ඩ පරිභෝජනයේදී හටගන්නා සමාජ ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා විශාල වීම මේවායේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයි.

  උදාහරණ - අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා,
  ලෙඩරෝග බෝවීම වැළැක්වීමට ලබාගන්නා එන්නත්

- අවගුණ භාණ්ඩ ලෙස හඳුන්වනු ලබන්නේ සුභසාධන භාණ්ඩවල ප්‍රතිවිරුද්ධ ස්වරූපයයි. කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් අවශේෂ සමාජයට ඍණ බාරිරතාවක් හෙවත් බාහිර පිරිවැයක් ඇතිකෙරේ නම් එම භාණ්ඩ අවගුණ භාණ්ඩ ලෙස හැඳින්නේ.

  උදාහරණ - දුම්වැටි, මත්පැන් හා මත්ද්‍රව්‍ය (පැහැදිලි කිරීම්වලට ලකුණු 02 බැගින් උදාහරණ වලට ලකුණු 2 බැගින්)

(ii)
- සාධාරණත්වය
- පිරිමැසුම්සහිත බව
- පහසුව
- නිශ්චිතවීම
- කාර්යකක්ෂම බව
- නම්‍යශීලී වීම (ලකුණු 04)

(iii) (අ) රාජ්‍ය අයවැයක වාර්තා ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් පුණරාවර්තන වියදම් අඩුකළ පසුව ඉතිරිවන ශේෂයයි. වර්තන ගිණුමේ ශේෂය ආණ්ඩුවේ ඉතුරුම් නිරූපණය කරයි. (ලකුණු 01)

ප්‍රදාන ඇතුලත් ආණ්ඩුවේ අයභාරයෙන් වර්තන හා ප්‍රාග්ධන වියදම්වලින් සමන්විත ආණ්ඩුවේ මුළු වියදම් අඩුකළ විට ලැබෙන ශේෂය සමස්ත අයවැය ශේෂයයි. (ලකුණු 01)

(ආ) අයවැය හිඟයමූල්‍යනය කිරීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර යොදාගනී. දේශීය මූල්‍ය සම්පත් අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා යොදාගනු ලැබුව හොත් අයහපත් ප්‍රතිවිපාක දෙකක් ඇති වේ.

ඉන් එක් ප්‍රතිවිපාකයක් වන්නේ පෞද්ගලික ආයෝජකයින්ට ආයෝජන සඳහා යොදා ගැනීමට ඇති සම්පත්වල හිඟයක් හටගැනීමයි. එවිට පෞද්ගලික අංශයේ ආයෝජන අඩුවීම තුළින් නිෂ්පාදනය අඩු වේ. (ලකුණු 02)

එසේම දේශීය මූලාශ්‍ර වෙත පෞද්ගලික අංශයෙන් රාජ්‍ය අයවැය හිගය මූල්‍යනය කිරීම සඳහා යොමු වීමත් නිසා එනම් සීමිත සම්පත් ප්‍රමාණයක් වෙත දෙඅංශයම තරගකිරීම නිසා ආර්ථිකයේ පොලී අනුපාතිකය ඉහළ යා හැකි ය. එවිට නැවත පෞද්ගලික අංශයේ ආයෝජන දුර්වල වේ. (ලකුණු 02)

(iv)
- ධන බාහිරතා ජනන කෙරහි නිෂ්පාදන හා පරිභෝජන ක්ෂේත්‍රයන් වෙළඳපොල ආන්ත්‍රණය ඔස්සේ ක්‍රියාත්මක වීමේදී එම ක්ෂේත්‍ර සඳහා සම්පත් ප්‍රමාණවත් ලෙස උපයෝජනය නොවීම නිසා අකාර්යක්ෂමතා පැනනගී. වෙළඳපොල ඔස්සේ සිදුවන නිෂ්පාදන හෝ පරිභෝජන මට්ටම් සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අවු මට්ටමක පවතිනු ඇත. මේවා නිවැරදි කරමින් ඒ අංශ ධෛර්යමත් කිරීමට රජය මැදිහත් විය යුතු ය.

  ඒ සඳහා මූලික වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තුනකි.

  - ධන බාහිරතා සහිත භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම වැඩි කිරීම. :- මෙයින් අදහස් කරන්නේ අදාළ බාණ්ඩ හා සේවා පමණක් මිලට ගැනීමට හැකිවන සේ පාරිභෝගික ක්‍රය ශක්තිය ඉහළ නැංවීමයි. මේ සඳහා පාරිභෝගිකයින් වෙත සහනාධාර ලබාදිය හැක. (ලකුණු 02)
  - ධන බාහිරතා සහිත භාණ්ඩ හා සේවාවල සැපයුම වැඩි කිරීම. මේ සඳහා ධන බාහිරතා ජනනය කෙරෙන ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන සහනාධාර ලබාදිය හැක. එවිට සැපයුම ප්‍රසාරණය කළ හැක. (ලකුණු 02)
  - අනෙක් ක්‍රියාමාර්ගය වන්නේ ඹන බාහිරතා ජනනය කෙරෙන භාණ්ඩය හෝ සේවාව වෙළඳපොල බලවේග ඔස්සේ නොසපයා ආණ්ඩුව විසින්ම එය සම්පාදනය කොට පවත්වාගෙන යාමේ වගකීම භාර ගැනීම. එමගින් සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම ලබාදීම පිළිබඳ වගකීම අණ්ඩුවට සහතික කළ හැකි ය. (ලකුණු 02)

  (ක්‍රියාමාර්ග තුන පමණක් දැක්වීමට ල කුණු 03යි. පැහැදිලි කිරීම් සහිතව දැක්වීමට මුළු ලකුණු හිමි වේ.)

08 (i) (අ) තායිලන්තය (ලකුණු 02)

(ආ)

| රට | ඇඟලුම් ඒකකයක ආවස්ථික පිරිවැය පාපැදි වලින් | පාපැදියක ආවස්ථික පිරිවැය ඇඟලුම් වලින් |
|---|---|---|
| තායිලන්තය | 0.5 | 2 |
| ඉන්දුනීසියාව | 0.25 | 4 |

(ඉ) දෙරටම වාසියාදයක හුවමාරුවක් සඳහා වෙළෙඳ අනුපාතය

ඇඟලුම් ඒකකයක් සඳහා : පාපැදි 0.25 ට වැඩි හා 0.5 ට අඩු

පාපැදියක් සඳහා : ඇඟලුම් ඒකක 2ට වැඩි සහ 4ට අඩු (ලකුණු 02)

(ii) නිදහස් වෙළඳාමට බාධා පමුණුවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග

- තීරුබදු පැනවීම
- සලාක හෙවත් කොටා නියම කිරීම
- දේශීය නිෂ්පාදකයන්ට සහනාධාර හෝ දිරිගැන්වීම් ලබා දීම.
- ප්‍රපතනය
- විදේශ විනිමය පාලනය
- ස්වෙච්ඡාවෙන් අපනයන සලාක පනවා ගැනීම
- ආනයන අපනයන පාලන සීමා
- වෙළඳ සම්බාධක පැනවීම
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම. (කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි.)

විදේශ මුදලේ මිල ඉහළ යාමක් යන්නෙන් අදහස් වන්නේ විදේශ මුදල් වලට සාපේක්ෂව දේශීය මුදලේ අගය පහළ යාමයි. (විනිමය අනුපාතය අවප්‍රමාණය වීමයි.) (ලකුණු 02)

මෙහි ප්‍රතිඵලයක් ලෙස ආනයන පිරිවැය වැඩිවන අතර එය ආනයන ආනයන අධෛර්යමත් කිරීමට හේතු වේ.

අපනයනවල මිල පහලයාමට හේතු වේ. මිල අඩු අපනයන හේතුවෙන් විදේශීය ආනයනකරුවන් ධෛර්යමත් වී දේශීය අපනයනවලට කරන ඉල්ලුම වැඩි වීමෙන් විදේශ මුදල් සැපයුම වැඩි වේ. (ලකුණු 02)

(iii) ගෙවුම් තුලන ලේඛනයක ඇතුලත් කරනු ලබන සෑම ගනුදෙනුවකම වටිනාකම ද්විත්ත්ව සටහන් ක්‍රමයට හර අගයක් (-) සහ බැර අගයක් (+) වශයෙන් තීරු දෙකක් වෙන වෙනම සටහන් කළ යුතු ය. එවිට එහි ඇතුලත් සියලු ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක හා හර තීරුවක සටහන් වන බැවින් සියලු ගනුදෙනුවල ශුද්ධ ශේෂය ශුන්‍ය අගයක් ගන්නා නිසා ද්විත්ත්ව සටහන් ක්‍රමය යටතේ ගිණුම් තැබීමේ දී ගෙවුම් තුලන ලේඛනය අනිවාර්යයෙන්ම තුලනය වේ. (ලකුණු 02)

ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය අතිරික්තයක් හෝ හිඟයක් වීම ගෙවුම් ශේෂ අසමතුලිතතාවක් ලෙස සැලකේ. (සමස්ත ගිණුමේ හිඟයක් මෙන්ම අතිරික්තයක් ද ආර්ථික වශයෙන් අහිතකර ප්‍රතිවිපාක බිහි කරන බැවින් බාහිර සමතුලිතතාව පවත්වාගෙන යාම සඳහා අසමතුලිත තත්වයන් ඇතිවීම වලක්වා ගත යුතු ය. (ලකුණු 02)

ලෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂය හෙවත් මූල්‍ය වෙනස්වීම් යනුවෙන් අදහස් කරන්නේ අදාල රටේ ජාත්‍යන්තර සංචිතවල ශුද්ධ වෙනස් වීමයි.වර්ෂය අවසානයේ පැවති ශුද්ධ සංචිත ප්‍රමාණයෙන් වර්ෂය ආරම්භයේ පැවති ශුද්ධ සංචිත ප්‍රමාණය අඩු කිරීමෙන් සමස්ත ශේෂය ගණනය කරයි.

(ලකුණු 1)

09 (i) ජාතික නිමැවුම හා ආදායම් මට්ටම ඉහළ නැංවීම උදෙසා කාලයත් සමග ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ප්‍රසාරණය කිරීම ආර්ථික වෘද්ධිය ලෙස හැඳින්වේ. (ලකුණු 02)

- ආර්ථික වෘද්ධියේ පිරිවැය.
- පාරිසරික ගැටළු ඇතිවීම.
- ආර්ථිකයේ උද්ධමනකාරී තත්ව පැනනැගීම
- ආදායම් විශමතා හට ගැනීම.
- ප්‍රාදේශීය විශමතා හට ගැනීම.
- ජනතාවගේ ශුභසාධනය වර්ධනය වන ආකාරයට ආයෝජන නොවුනහොත් ජීවන තත්වයට බලපෑම් ඇතිවීම.
- වර්තමාන පරිභෝජනය පහළ යාම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 03කට ලකුණු 03යි)

(ii)
- කාර්මීකරණය වේගවත් වීම.
- නිෂ්පාදන සම්පත්වල ඵලදායකත්වය ඉහළ යාම.
- නිෂ්පාදන ශිල්පක්‍රම හා තාක්ෂණය උසස් වීම.
- නවීකරණය වීම.
- නිෂ්පාදන අංශයන්හි ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවීම.
- දුගීබව, විරැකියාව අඩුවීම හා ආදායම් ව්‍යාප්ති විෂමතා නැතිවීම.
- පරිභෝජන රටාව වෙනස් වීම.
- සේවා නියුක්ති ව්‍යුහය වෙනස්වීම.
- විදේශ වෙළඳාමේ ව්‍යුහය වෙනස්වීම (ප්‍රාථමික භාණ්ඩ අපනයන අඩු වී කාර්මික අපනයනය වැඩි වීම)
- ආණ්ඩුවේ කාර්යභාරය ක්‍රමයෙන් අඩුවීම. (ඕනෑම කරුණු 04කට ලකුණු 04යි.)

(iii)
- ආර්ථික වර්ධනය පහළ මට්ටමක පැවතීම.
- ජන සංඛ්‍යාව වර්ධනය වීම.
- ස්වාභාවික විපත්
- යටිතල පහසුකම් දුර්වල වීම.
- අයහපත් රාජ්‍ය පාලනය.
- අධ්‍යාපන, සෞඛ්‍ය සේවා දුර්වල වීම.
- වෙළඳපොළට පිවිසීමේ බාධා
- කුටුම්භවල විශාලත්වය
- පෝෂණ මට්ටම්වල විෂමතා
- සංස්කෘතික බලපෑම්
- අභ්‍යන්තර ගැටුම්

(ඕනෑම කරුණු 4කට ලකුණු 04)

(iv) • දීර්ඝ හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් නොමැතිවීම.
• යහපත් ජීවන තත්වයක් නොලැබීම.
• දැනුම නොමැති වීම. (කරුණු 03ට ලකුණු 03)

(v) • ආහාර සුරක්ෂිතතාව හා පෝෂණයට අදාළ විෂමතාවයන්
• වසංගතය හේතුවෙන් හා ඉන් අනතුරුව උත්සන්න වුනු ආර්ථික අර්බුධය
• ආහාර මිල ගණන් ඉහළ යාම.
• බලශක්ති අර්බුදය
• සැපයුම් දාමයන්හි අවහිරතා
• වැයකළ හැකි ආදායම සංකෝචනය වීම.

(එක් කරුණකට 01 බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04)

10 (i) • මූල්‍ය ආරක්ෂණ ජාලයක් යනුවෙන් සාමාන්‍ය ආර්ථික තත්ත්වය යටතේ කාර්යක්ෂම සහ ස්ථාවර බැංකු පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමත්, අනපේක්ෂිත මූල්‍ය අර්බුධකාරී අවස්ථාවකදී එය කළමනාකරණය කිරීමත් අරමුණු කරගත් ආයතන නීති හා ක්‍රියා පටිපාටි සමූහයකි. (ලකුණු 03)
• මෑත වසරවලදී මූල්‍ය පද්ධතියේ කැපී පෙනෙන වර්ධනයක් සහ එහි සංකීර්ණත්වය වැඩිවීමත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් දැකිය හැකි විය. මේ හේතුවෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ කම්පන හා අර්බුධකාරී තත්ත්වයන් මත ඇතිවිය හැකි අනතුරුදායක බව දිගින් දිගටම වර්ධනය වීමත් සිදුවිය. මෙම තත්ත්වයන්ට මුහුණදීම සඳහාත්, තැන්පත්කරුවන් සහ අනෙකුත් පාර්ශව කරුවන් ආරක්ෂා කිරීම සඳහාත් මූල්‍ය ආරක්ෂණ ජාලය වැදගත් වේ. (ලකුණු 03)

(ii) • අවිනිශ්චිත රාජ්‍ය ප්‍රතිපත්ති.
• සීමාකාරී කම්කරු රෙගුලාසි
• ව්‍යාපාර කිරීමේ පහසුවෙහි ප්‍රගතියක් නොමැතිකම
• දේපල හිමිකම් සුරැකීමේ නොගැළපීම්.
• නීතිය හා සාමය පවත්වාගෙන යාමේ දුර්වලතා
• දූෂණය
• දුර්වල රෙගුලාසි
• ඉහළ නිලධාරීවාදය
• දුර්වල යටිතල පහසුකම් (එක් කරුණකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04යි.)

(iii) • සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්වයට පත්කිරීම.
• ණය තිරසරභාවය යථා තත්වය පත් කිරීම.
• ආදායම් වැඩි කිරීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව කඩිනමින් සිදුවීම.
• මිල ස්ථායීතාව යථා තත්වයට පත් කිරීම.
• බාහිර ස්වාරක්ෂක යළි ගොඩනැගීම.
• මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම.
• දූෂණ අවධානම් සහගත තත්වයන් අවම කිරීම.
• ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ නැංවීම. (කරුණු 1 ට ල. 1 බැගින් ල. 06 යි.)

(iv) • 2032 වන විට රාජ්‍ය ණය ප්‍රමාණය ද. දේ. නිෂ්පාදනයෙන් 95 % ට වඩා අඩු කර ගැනීම.
• 2027 - 2032 කාල පරිච්ඡේදය තුළ මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සමාන්‍ය ද. දේ. නිෂ්පාදිතයෙන් 13 % කට වඩා පහළ මට්ටමක පවත්වාගෙන යාම.
• මධ්‍යම රජයේ වාර්ෂික විදේශීය මුදලින් ණය සේවාකරණය 2027 -2032 දක්වා කාල පරිච්ඡේදය තුළ සෑම වරකටම ද. දේ. නිෂ්පාදනයෙන් 4.5% කට වඩා පහළ මට්ටමක පවත්වාගෙන යාම.
• විදේශ මූල්‍යන පරතරයෙන් පියවීම සඳහා ප්‍රමාණවත් පරිදි 2027 - 2032 කාල පරිච්ඡේදය තුළ ණය සේවාකරණය අඩු කිරීම.

(කරුණකට ල. 2 බැගින් ල. 4 යි)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න